2020 මුදල් වර්ෂය සඳහා

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ

# කාර්ය සාධන වාර්තාව

2020 ஆம் ஆண்டிற்கானs

காணி உரித்து நிருணய ஆணையாளர் நாயகத்தின்

# செயல் இலக்கு அறிக்கை

# PERFORMANCE REPORT

**of the Commissioner General of Land Title Settlement**
**for the Financial Year 2020**


ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

காணி உரித்து நிர்ணயத் திணைக்களம்

**LAND TITLE SETTLEMENT DEPARTMENT**

## ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්වරයාගේ පණිවිඩය

1998 සිට මේ දක්වා වන වසර 22 ක කාලය තුළ ලද අත්දැකීම්, උගත් පාඩම් හා ඉටු කර ඇති කාර්යය සමාලෝචනය කර මඟ සකස් කර ගැනීමට සුදුසු අවධිය එළඹ ඇතැයි සිතමි.

පෙර අනුමත වූ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත්වලට වඩා වැඩි කාලයක් 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත ක්‍රියාත්මක වී ඇත. වසර 15කදී දිවයිනම මැන හිමිකම් නිරවුල් කිරීමේ අභිප්‍රායෙන් සංඛ්‍යාත්මකව ගණන් බලන ලද කාර්ය මණ්ඩලයක් අනුමත කර ගන්නා ලද නමුත් එම සංඛ්‍යා කිසි දිනෙක දෙපාර්තමේන්තුව වෙත ලැබී නැත. දිවයින පුරා පිහිටි කාර්යාල ක්‍රමයක් මධ්‍යගතව අධීක්ෂණය හා මෙහෙයවීම කෙතෙක් දුරට ප්‍රායෝගිකද යන්න සලකා බලා ඒ අනුව ඉදිරි කටයුතු සැලසුම් කිරීම වඩාත් උචිත වනු ඇත. මැනුම් කරනු ලබන ඉඩම් කැබලි සංඛ්‍යාවෙන් හිමිකම් නිරවුල් කිරීමේ ප්‍රතිශතාත්මක වර්ධනයක් පැවතිය ද වසර 22ක් ගතවන විටත් දිවයිනේ ඉඩම් කැබලි මිලියන 12ක් අතුරින් මැනීමට හැකිව ඇත්තේ මිලියන 1.51ක් පමණක් බවත් හිමිකම් නිරවුල් කර ඇත්තේ මිලියන 0.72කට ආසන්න සංඛ්‍යාවක පමණක් බවත් ලක්ෂ 3.7ක පමණ ප්‍රමාණයක් විවිධ හේතු නිසා තීරණදීමට නොහැකි තත්ත්වයක පවතින ආකාරයත් සලකන විට සමස්ත හිමිකම් නිරවුල් කිරීමේ වැඩ සටහනත් එහි නීතියේ ප්‍රායෝගිකභාවය, ආයතනික ව්‍යුහය, ක්‍රමෝපායන් හා ආයතනික ක්‍රියාකාරීත්වයත් නැවත සමාලෝචනය ඉතා අවශ්‍ය බව පෙනේ.

කෙසේ වුවද 1998 සිට මේ දක්වා දෙපාර්තමේන්තුව වශයෙන් ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ලබා ගෙන ඇති සමස්ත ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත් විය නොහැකි අතර මේ සඳහා විවිධ බාහිර මෙන්ම අභ්‍යන්තර හේතූන්ද ප්‍රමුඛතා වෙනස් වීම, පනතේ දුර්වලතා, අපේක්ෂිත කාර්ය මණ්ඩලයක් නොලැබීමද, හිමිකම් නිරවුල් කිරීම වැනි සංකීර්ණ කාර්යය සඳහා පුහුණුව ලැබූ විමර්ශන කාර්ය මණ්ඩලයට දෙපාර්තමේන්තුව තුළින් ඉවත්වීමට ඉඩ ලැබීම ආදී ගැටළු මෙන්ම පුද්ගලික ඉඩම් පිළිබඳ හිමිකම් තීරණය කිරීමේදී මතුව ඇති අනපේක්ෂිත ගැටළුද හේතු වූ බව පෙනී යයි.

2020 වසරේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි අතර උද්ගත වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ කෙරුනු රාජකාරි සීමා වීම ඊට බලපෑ ප්‍රබල හේතුව වශයෙන් දකිමි.

ශ්‍රී ලංකාව දීර්ඝ ඉතිහාසයක් සහිත ඒ නිසාම ඉඩම් හිමිකම් පිළිබඳ සංකීර්ණ නීති සම්ප්‍රදායන්, භාවිතයන්ගෙන් මෙන්ම විචිත්‍ර ආකල්පයන්ගෙන් යුත් ජනතාවක් සහිත රටකි. එබැවින්ම ගැටළුකාරී සංකීර්ණ තත්ත්වයන් අවම කර ගනිමින් හා හිමිකම් නිරවුල් කර ගැනීමට ප්‍රමුඛතාව ලැබෙන ලෙස හිමිකම් ලියාපදිංචි කිරීමේ (බිම් සවිය) වැඩසටහන සැලසුම් කිරීමේ අවශ්‍යතාව ද දකිමි.

වැඩ සටහන සාර්ථක කර ගැනීම සඳහා සර්වේයර් ජනරාල් හා අතිරේක සර්වේයර් ජනරාල් (හි.ලි.ප.) ඇතුළු ඔහුගේ කාර්යය මණ්ඩලය දෛනිකව දෙනු ලබන අනගි සහය නොවන්නට මෙතරම් හෝ දුරක් ගමන් කිරීම දුෂ්කර වනු ඇත. ඔහුටත් එම දෙපාර්තමේන්තුවටත් මේ අවස්ථාවේ කෘතඥතාවය පළ කළ යුතුය. රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවෙන් වැඩ සටහන සම්බන්ධීකරණය කළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්, සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (හි.ලි.ප.) හා කාර්ය මණ්ඩලයටත්, බිම් සවිය වැඩ සටහනේ අවශ්‍යතාවය හොඳින් වටහාගත් ඒ සඳහා විශාල ධෛර්යයක් දුන් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ගරු අමාත්‍යතුමා සහ රාජ්‍ය අමාත්‍යතුමාත් පසුව ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ගරු අමාත්‍යතුමා, රාජ්‍ය අමාත්‍යතුමා ඇතුළු කාර්ය මණ්ඩලවලටත් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය වෙනුවෙන් ධෛර්යයෙන්, කැපවීමෙන් වැඩකළ දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරුන් දෙදෙනා ඇතුළු සියළුම ප්‍රධාන කාර්යාලයේ හා ක්ෂේත්‍රයේ නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරුන් ඇතුළු නිලධාරී සැමටත් මගේ කෘතවේදීත්වය පළ කරමි.

පී.එම්.එච්.ප්‍රියදර්ශනී

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්

## පටුන


පරිච්ඡේදය 01 ........ 1

ආයතනික පැතිකඩ ........ 1

1.1 හැඳින්වීම ........ 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු ........ 2

1.3 කාර්යයන් ........ 3

1.4 සංවිධාන සටහන ........ 4

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ ........ 4

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල් ........ 5

1.7 විදෙස් ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු ........ 5

පරිච්ඡේදය 02 ........ 6

ප්‍රගතිය හා ඉදිරි දැක්ම ........ 6

පරිච්ඡේදය 03 ........ 7

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය ........ 7

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ........ 7

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........ 8

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ........ 9

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් ........ 10

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ........ 19

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ........ 19

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 20

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ........ 21

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව ........ 21

පරිච්ඡේදය 04 ........ 22

කාර්ය සාධන දර්ශක ........ 22

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක ........ 22

පරිච්ඡේදය 05 ........ 23

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ........ 23

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු ........ 23

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ........ 23

පරිච්ඡේදය 06 ........ 24

මානව සම්පත් පැතිකඩ ........ 24

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ........ 24

6.2 ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි මානව සම්පත් හිඟයෙහි/ අතිරික්තයෙහි බලපෑම 24

6.3 මානව සම්පත් සංවර්ධනය ........ 24

පරිච්ඡේදය 07 ........ 26

අනුකූලතා වාර්තාව ........ 26

**ඇමුණුම්**

01. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව - නිරවුල් කිරීමේ නිලධාරින් / කොමසාරිස්වරුන්ගේ / කොමසාරිස් ජනරාල්වරුන්ගේ නාම ලේඛනය
02. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන
03. විගණකාධිපතිවරයාගේ වාර්තාව

# 2020 මුදල් වර්ෂය සඳහා
# ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ
# කාර්ය සාධන වාර්තාව

## පරිච්ඡේදය 01
## ආයතනික පැතිකඩ

### 1.1 හැඳින්වීම

### දෙපාර්තමේන්තු ඉතිහාසය

ඉඩම් නිරවුල් කිරීම යනු රජයේ ඉඩම් පුද්ගලික ඉඩම් මොනවාද යන්න තීන්දු කර පුද්ගලික ලෙස තීන්දු කළ ඉඩම් අදාළ උරුමකරුවන් වෙත පුද්ගලික අයිතියට පවරා දීමත් එම ඉඩම් සඳහා ඔවුනට පිඹුරුපතක් නිකුත් කිරීමත් රජය සතු ඉඩම් රජය වෙත පවරා දීමත්ය. මෙවැනි ක්‍රියාවලියක් මේ රටට අවශ්‍ය වූයේ යම්කිසි ඓතිහාසික පසුබිමක් පදනම් කරගෙනය. වසර දහස් ගණනක් තිස්සේ මේ රටේ ජනතාව ඉඩම් භුක්ති විඳීමත්, පරිහරණය කිරීමත් කළ ද ඔවුන්ට එම ඉඩම්වල අයිතිය පවරා දිමක් සිදු නොවීය. ඉඩම්වල හිමිකම සනාථ කළ හැකි ඔප්පු තිරප්පු වැනි ලිඛිත සාක්ෂි කිසිවක් ඔවුන්ට නොවීය. මෙවැනි තත්ත්වයක් යටතේ බ්‍රිතාන්‍ය පාලකයින් විසින් 1840 අංක 12 දරන අනවසර ඉඩම් ආඥා පනත ප්‍රකාශයට පත් කරන ලදී.

මුලික වශයෙන් එම ආඥා පනතින් ප්‍රකාශ කරන ලද්දේ යම්කිසි පුද්ගලයකුට තම ඉඩම තමාට අයත් බව සනාථ කිරීමට නොහැකි වන්නේ නම්, එම ඉඩම රාජ සන්තක වන බවයි. මිනිසුන්ගේ පරම්පරාගත පරම්පරාගත භුක්තිය හා වගාව බ්‍රිතාන්‍ය පාලකයින් විසින් සැලකිල්ලට නොගන්නා ලදී. ඔවුන් අදහස් කළේ අයිතිය සනාථ කිරිම ඔප්පු, තිරප්පු, සන්නස් වැනි ලිඛිත සාක්ෂි මඟින් කළ යුතු බවයි. මෙම තත්ත්වය යටතේ 1840 අනවසර ඉඩම් ආඥා පනත නිසා මිනිසුන්ගේ ඉඩම් අක්කර දහස් ගණනින් ඔවුනට අහිමි විය. ලංකාවේ ජනතාවට සිදු වු මෙම අසාධාරණය පිළිබඳව එවකට සිටි ලංකාවේ දේශීය නායකයින් සිය විරෝධතාවය හා කනස්සල්ල ප්‍රකාශ කරන ලදී. මේ අනුව මෙම ගැටලුවට විසඳුමක් වශයෙන් රජයේ ඉඩම් මොනවාද පුද්ගලික ඉඩම් මොනවාද යන්න තීන්දු කිරීමේ නිරවුල් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට බ්‍රිතාන්‍ය පාලකයින්ට සිදු විය. ඒ අනුව 1897 අංක 01 දරන මුඩු බිම් ආඥා ආඥා පනත පනවන ලදී. මුලින් දිසාපතිවරුන් හා විශේෂ නිලධාරින් විසින් ක්‍රියාත්මක කරන ලද ඉඩම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය 1903 දී ස්ථාපිත කරන ලද ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව යටතට පත් කරන ලදී. මුඩුබිම් ආඥා පනත ක්‍රියාත්මක කිරීමේදී ඇතිවු අඩුපාඩු හා ඉන් ජනතාවට සිදු වූ අසාධාරණකම් නැති කර ගැනීමේදී වඩාත් නිවැරදිවූත් නීත්‍යානුකූලවූත් නිරවුල් කිරීමේ ක්‍රියාවලියක් සිදු කිරිම සඳහා 1931 අංක 20 දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත පනවන ලදී.

දෙපාර්තමේන්තුවට අදාළ වූ මෙම ඉඩම් නිරවුල් කිරීමේ කාර්යය එසේම පවතින අතරතුරදී 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සම්මත වීම මත ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යයටද අවතීර්ණ විය. රජයේ සහ පුද්ගලික ඉඩම් වල අයිතිය තහවුරු කිරීම තුළින් දියුණු ඉඩම් කළමනාකරණ ක්‍රමයක් ඇති කිරීමත් ඉඩම් හා සම්බන්ධ වංචා, දූෂණ අවම කිරීමත් මෙහි ප්‍රමුඛ අරමුණ වේ. එමෙන්ම එකී කාර්ය භාරය වර්තමානය වන විට දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරය බවට පත්වී ඇත.

**1903 සිට 2020 දක්වා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නාම ලේඛනය**
***(ඇමුණුම් අංක 01 හි දක්වා ඇත)***

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

### දැක්ම

සෑම ඉඩමකටම නිරවුල් හිමිකමක්

### මෙහෙවර ප්‍රකාශය

ඉඩම් නිරවුල් කිරීමේ හා හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාදාමය තුළින් රජයේ හා පෞද්ගලික ඉඩම් අයිතිය තීරණය කොට, සෑම බිම් කොටසකම හිමිකම තහවුරු කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ දියුණු ඉඩම් කළමනාකරණ ක්‍රමයකට දායක වීම.

### අරමුණු

1. ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ රජයේ සහ පුද්ගලික ඉඩම් අයිතිය තීරණය කිරීම.
2. හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ උරුම අයදුම්පත් කැඳවීම, විමර්ශන කටයුතු සිදුකිරීම සහ හිමිකම් තීරණය කිරීම ඇතුළු අනෙකුත් කටයුතු කිරීම.
3. ආයතනික හැකියාව ශක්තිමත් කිරීම මගින් හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු හා ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම.
4. මනා ක්‍රියාකාරිත්වයකින් යුත් හිමිකම් විමර්ශන කාර්යාල ප්‍රාදේශීය මට්ටමින් පවත්වාගෙ යාම මගින් හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම.
5. හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතුවල සියලු අවස්ථාවන් සඳහා මහජන සහයෝගය ලබා ගැනීම සහ මහජන විශ්වාසය තහවුරු කරගැනීමට කටයුතු කිරීම.
6. ඉඩම් අයිතිය පිළිබඳ කාර්යක්ෂම සහ විශ්වාසනීය තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.
7. කාර්යක්ෂම පරිපාලන සහ ගිණුම් ක්‍රම පවත්වාගෙන යාම.

## 1.3 කාර්යයන්

දෙපාර්තමේන්තුව සතු මූලික කාර්යයන් පහත දැක්වේ.

- ❖ හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු, ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සහ කාර්යාලීය පරිපාලනය කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ක්‍රමවේදයන් සහ පටිපාටි හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.

- ❖ හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමට අදාළ කටයුතු වන,

  අ) ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම

  ආ) උරුම අයදුම්පත් කැඳවීම

  ඇ) හිමිකම් විමර්ශන පැවැත්වීම

  ඈ) හිමිකම් තීරණය කිරීම

  ඉ) හිමිකම් තීරණය ගැසට් කිරීම යනාදිය ඉටු කිරීම.

- ❖ ඉඩම් නිරවුල් කිරීමට අදාළ කටයුතු වන,

  අ) නිරවුල් කිරීමේ උරුම විභාග පැවැත්වීම

  ආ) නිරවුල් කරන ලද ඉඩම් මැන වෙන් කිරීමට යැවීම

  ඇ) නිරවුල් කිරීමේ ආඥා ගැසට් පත්‍රයේ පළ කර ප්‍රසිද්ධ කිරීම

  ඈ) නිරවුල් කිරීමෙන් පසු ගම් නිදහස් කිරීම යනාදිය ඉටු කිරීම.

- ❖ හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු වලදී අදාළ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම.

- ❖ කාර්ය මණ්ඩලයේ රාජකාරි කාර්යක්ෂමව සිදුකිරීමට අවශ්‍ය පුහුණුව සහ අනෙකුත් සම්පත් අවශ්‍යතා හඳුනාගෙන ඒවා සපයා දීම.

- ❖ හිමිකම් විමර්ශනය සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සඳහා කාර්ය සාධන දර්ශක සැකසීම සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.

- ❖ හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතුවල ප්‍රගතිය මාසිකව අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම.

- ❖ ඉඩම් නිරවුල් කිරීමට අදාළ පැරණි සහ වටිනා ලේඛන සංරක්ෂණය කිරීම සඳහා කාර්යක්ෂම ලේඛන සංරක්ෂණ පද්ධතියක් පවත්වාගෙන යාම.

- ❖ හිමිකම් ලියාපදිංචි කිරීම පිළිබඳ මහජන අවබෝධය වර්ධනය කිරීම සහ සහයෝගය ලබා ගැනීම පිණිස දැනුවත් කිරීමේ රැස්වීම්, සාකච්ඡා සහ වැඩමුළු පැවැත්වීම.

- ❖ ප්‍රාදේශීය කාර්යාලවල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම සහ ඔවුන්ට අවශ්‍ය සම්පත් ලබාදීම මඟින් මහජන අවශ්‍යතා සපුරා ගැනීමට අවකාශ සැලසීම.

- ❖ වාර්ෂික ඇස්තමේන්තු, විසර්ජන ගිණුම්, රජයේ නිලධාරින්ගේ ඇස්තමේන්තු ගිණුම් සහ මාසික ගිණුම් සාරාංශ සැකසීම.

## 1.4 සංවිධාන සටහන

*(ඇමුණුම් අංක 02 හි දක්වා ඇත)*

## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- හිමිකම් නිරවුල් කිරීමේ අංශය
- ඉඩම් නිරවුල් කිරීමේ අංශය

**දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය කාර්යාලය |
|---|---|
| ගම්පහ | දිවුලපිටිය |
| | මීනුවන්ගොඩ |
| | මීරිගම I/II |
| | මහර |
| | අත්තනගල්ල |
| | දොම්පේ |
| | ගම්පහ |
| | ජා ඇල |
| | වත්තල |
| | කටාන |
| රත්නපුර | බලංගොඩ |
| | වැලිගෙපොල |
| | රත්නපුරය |
| | නිවිතිගල |
| | කුරුවිට |
| කොළඹ | හෝමාගම |
| | මොරටුව |
| | කැස්බෑව |
| | රත්මලාන |
| | දෙහිවල |
| මහනුවර | දොළුව/උඩපළාත |
| | යටිනුවර |
| | උඩුනුවර |
| | හාරිස්පත්තුව |
| | ගඟවටකෝරලේ |
| නුවරඑළිය | කොත්මලේ |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය කාර්යාලය |
|---|---|
| අනුරාධපුරය | තඹුත්තේගම |
| | තලාව |
| | රාජාංගනය |
| | නැගෙනහිර නුවරගම් පළාත |
| හම්බන්තොට | ලුනුගම්වෙහෙර |
| | තිස්සමහාරාමය |
| | හම්බන්තොට |
| | බෙලිඅත්ත |
| කුරුණෑගල | රිදීගම |
| | මල්ලව පිටිය |
| | කුරුණෑගල |
| | පන්නල |
| | වාරියපොල |
| මොණරාගල | සියඹලාණ්ඩුව |
| බදුල්ල | රිදීමාලියද්ද |
| | මහියංගනය |
| පොළොන්නරුව | මැදිරිගිරිය |
| | හිගුරක්ගොඩ |
| මාතලේ | දඹුල්ල |
| | ගලේවෙල |
| පුත්තලම | වෙන්නප්පුව |
| | පුත්තලම |
| කළුතර | පානදුර |
| | හොරණ |
| | කළුතර |
| ගාල්ල | ගාල්ල |
| | හික්කඩුව |
| | ඇල්පිටිය |
| මාතර | වැලිගම |
| | මාතර |
| කෑගල්ල | ගලිගමුව |
| යාපනය | නල්ලුර් |

## 1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්

අදාළ නොවේ.

## 1.7 විදෙස් ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අදාළ නොවේ.

# පරිච්ඡේදය 02
# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2020 වර්ෂයේදී 12 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සිතියම් 399ක ඉඩම් කැබලි 56,541ක් මැනුම් සිදු කර අප දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති අතර කැබලි 24,450ක් සම්බන්ධයෙන් 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ ලබා දීමට දෙපාර්තමේන්තුව සමත්වී ඇත. මෙය 2019 වර්ෂයේදී පිළිවෙලින් සිතියම් 399 ක ඉඩම් කැබලි 58,016ක් හා 51,903ක් වේ. එමෙන්ම පනතේ 14 වගන්තිය යටතේ වන තීරණ අතුරින් මෙම වර්ෂයේදී ඉඩම් කැබලි 19,328ක් ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇති අතර ඉඩම් කැබලි 23,441ක් හා සම්බන්ධ උපලේඛන හිමිකම් ලියාපදිංචිය සඳහා සහ හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත යොමු කොට ඇත. හිමිකම් ප්‍රකාශිත ගැසට් නිවේදනය පිළිබඳ විරෝධතාවක් ඇතොත් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි මාසයක කාල පරාසයකින් පසු හිමිකම් සහතික සැකසීම සඳහා රෙජිස්ට්‍රාර් කාර්යාලවලට යොමු කරන අතර 2021 වර්ෂය සඳහා 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ ලබා දීමට අපේක්ෂිත ඉලක්කය 91,000 බවද සඳහන් කරමි.

.......................................
ප්‍රධාන ගණන් දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2021/02/25

ආර්. ජී. ජී. කේ. රණවක
ලේකම්
ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර" ඉඩම් ලේකම් කාර්යාලය
අංක. 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

පී. එම්. එච්. ප්‍රියදර්ශනී
.......................................
ගණන් දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2021 . 03 . 16

පී. එම්. එච්. ප්‍රියදර්ශනී

# පරිච්ඡේදය 03
# වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

රු.

| අයවැය 2020 | | සටහන | තත්‍ය 2020 | තත්‍ය 2019 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **-** | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | **-** | - | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 537,894,000 | 520,704,648 | ඒසීඒ-3 |
| | තැන්පතු | | 4,971,787 | 4,566,685 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගිණුම් | | 14,564,784 | 21,525,905 | ඒසීඒ-5 |
| | වෙනත් ලැබීම් | | 23,905,832 | 25,658,075 | |
| | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **581,336,403** | 572,455,313 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **581,336,403** | **572,455,313** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | **-** | - | |
| 456,100,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 449,715,192 | 398,924,813 | |
| 28,294,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 13,399,609 | 17,762,745 | ඒසීඒ-2(ii) |
| 8,500,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 7,921,598 | 7,870,198 | |
| | පොළී ගෙවීම් | 8 | - | - | |
| | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| 492,894,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **471,036,399** | **424,557,756** | |
| | **මූලධන වියදම්** | | | | |
| 4,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 2,017,063 | 2,577,615 | |
| 2,200,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 516,929 | 1,215,006 | |
| | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | | | ඒසීඒ-2(ii) |
| | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | | | |
| 1,900,000 | හැකියා වර්ධනය | 14 | 472,348 | 603,023 | |
| | වෙනත් මූලධන වියදම් | 15 | | - | |
| 8,100,000 | **මුළු මූලධන වියදම් (ඉ)** | | **3,006,340** | **4,395,644** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **20,753,349** | 29,204,495 | |
| | **තැන්පතු ගෙවීම්** | | 4,879,015 | 4,865,519 | ඒසීඒ-4 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 15,874,334 | 24,338,976 | ඒසීඒ-5 |
| | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | **494,796,088** | 458,157,895 | |
| 500,994,000 | **.........දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | **86,540,315** | **114,297,418** | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2020 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | සත්‍ය 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | - |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 250,582,237 | 249,427,012 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම | ඒසීඒ-5/5(ඒ) | 53,675,654 | 52,366,104 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 2,657,546 |
| මුළු වත්කම් | | 304,257,891 | 304,450,662 |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| ශුද්ධ වත්කම් | | 53,582,882 | 52,366,104 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 250,582,237 | 249,427,012 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම | ඒසීඒ-4 | 92,772 | |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 2,657,546 |
| මුළු වගකීම් | | 304,257,891 | 304,450,662 |

පිටු අංක ..5.. සිට ..23.. දැක්වෙන ඉහත ඒසීඒ 1සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 24 සිට 31 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි ම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ............................ | පී.එම්.එච්.ප්‍රියදර්ශනී ............................ | ............................ |
| ප්‍රධාන ගණන් දීමේ නිලධාරී | ගණන් දීමේ නිලධාරී | ප්‍රධාන ගණකාධිකාරී |
| නම : | නම : | නම : එස්. පී. [illegible] |
| තනතුර : | තනතුර : | දිනය : 2021.3.16 |
| දිනය : 2021/03/25 | දිනය : 2021.03.16 | |

ආර්. ඒ. ඒ. කේ. රණවක
ලේකම්
ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර" ඉඩම් මෙහෙවර කාර්යාලය
අංක. 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

පී. එම්. එච්. ප්‍රියදර්ශනී
අංක. 1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ප්‍රධාන ගණකාධිකාරී
අංක. 1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර
බත්තරමුල්ල.

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තත්‍ය 2020 රු. | 2019 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර ලාභ | | |
| ආදායම් නොවන ලැබීම් | 23,838,068 | 25,658,076 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | |
| අග්‍රිම ලැබීම් | 537,894,000 | 520,704,648 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | 561,732,068 | 546,362,724 |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 462,328,466 | 414,611,772 |
| සහනාධාර සහ මාරුකිරීම් | 7,921,598 | 7,870,198 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 91,379,063 | 118,448,982 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 424,000 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | 562,053,127 | 540,930,952 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | (321,059) | 5,431,772 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | | |
| ලාභාංශ | | |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | 67,765 | |
| උපණය අයකර ගැනීම් | | |
| අත්තිකාරම් අයකර ගැනීම් | 11,852,241 | 18,207,488 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | 11,920,006 | 18,207,488 |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 2,606,342 | 3,395,644 |
| අත්තිකාරම් ගෙවීම් | 9,085,377 | 17,287,235 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | 11,691,719 | 20,682,879 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | 228,287 | (2,475,391) |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | (92,772) | 2,956,381 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | | |
| විදේශීය ණය ගැනීම් | | |
| ප්‍රදානයන් ලැබීම් | | |
| තැන්පතු ලැබීම් | 4,971,787 | 4,566,684 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | 4,971,787 | 4,566,684 |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | |
| තැන්පතු ගෙවීම් | 4,879,015 | 4,865,519 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | 4,879,015 | 4,865,519 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | 92,772 | (298,835) |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | 0 | 2,657,546 |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | 0 | |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | 0 | |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

සටහන - (i)

**පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය**

**(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)**

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය:287
වැඩසටහන් අංකය හා නාමය:

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම්/කපාහැරීම්/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

| | අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|---|
| රු | 25,000.00 | අඩු | 0 | 0.00 |
| රු | 25,000.01 | වැඩි | 1 | 80,500.00 |
| | එකතුව | | 1 | 80,500.00 |

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය

| | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| CAD 6924 | 1 | 80,500.00 |
| | 1 | 80,500.00 |

(ii) කල්දැරවත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

| | අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|---|
| රු | 25,000.00 | අඩු | 2 | 44,250.00 |
| රු | 25,000.01 | වැඩි | 1 | 399,000.00 |
| | එකතුව | | 3 | 443,250.00 |

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය

| | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| එකතුව | 0 | 0.00 |

(ii) අනුව කාල විශ්ලේෂණය

| | | |
|---|---|---|
| වසර 5 ට අඩු | සිද්ධි සංඛ්‍යාව | 1 |
| | | |
| | ගණන | රු 22,000.00 |
| වසර 5-10 | සිද්ධි සංඛ්‍යාව | 2 |
| | ගණන | රු 421,250.00 |
| වසර 10 ට වැඩි | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | |

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

..............................................
ගණන් දීමේ නිලධාරී/ මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 21-3-16

## පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය:287
වැඩසටහන් අංකය හා නාමය:

1 වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

| | අගය | | සිද්ධි සංඛ්‍යාව | වටිනාකම (රු) |
|---|---|---|---|---|
| (i) | රු. 25,000.00 අඩු | .............. | 0 | 0 |
| (ii) | රු. 25,000.01 වැඩි | .............. | 1 | 80500.00 |
| | එකතුව | | 1 | 80500.00 |

2 වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය

| අලාභයේ ස්වභාවය | ආරම්භක කපා නොහල ශේෂය රු. | අලාභයේ වටිනාකම රු. | අයකර ගැනීම් රු. | පොතෙන් කපා හල අගය රු. | කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු. | පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය |
|---|---|---|---|---|---|---|
| 1 32-3129 වාහන අනතුර | 22,000.00 | - | - | - | 22,000.00 | |
| 2 PC-2375 වාහන අනතුර | 399,000.00 | - | - | - | 399,000.00 | |
| 3 HQ-7234 වාහන අනතුර | 22,250.00 | - | - | - | 22,250.00 | |
| 4 CAD-6924 වාහන අනතුර | - | 80,500.00 | 80,500.00 | - | - | |
| එකතුව | 443,250.00 | 80,500.00 | 80,500.00 | - | 443,250.00 | |

සටහන - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

..........................................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2021.03.16

[illegible]
ප්‍රධාන ගණකාධිකාරී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
අංක. 1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

## බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය:287
වැඩසටහන් අංකය හා නාමය: 2 - සංවර්ධන වැඩසටහන

| සැපයුම්කරුගේ/ආයතනයේ නම | බැඳීම් අංකය | මාසය | දිනය | ශීර්ෂය | වැඩසටහන | ව්‍යාපෘතිය | උප ව්‍යාපෘතිය | වැය විෂයය | මූල්‍යකරණය | අයිතමය පිළිබඳ විස්තරය | බැඳීම් | බැඳීම් ශේෂය | බැරකම්වලට ඇතුළත් වූ දිනය | බැරකම් වටිනාකම | බැරකම් සඳහා වන සංශෝධනයන් | බැරකම් නිදහස් කිරීම | බැරකම් ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු | | | | | | | | | | | | | | | | | |
| අතිකාල දීමනා | C/2021/HR002 | 12 | 31 | 287 | 2 | 1 | 0 | 1002 | | | | | 12/31/2020 | 13,761.80 | | 13,761.80 | - |
| ගමන් වියදම් | | 12 | 31 | 287 | 2 | 1 | 0 | 1101 | | | | | 12/31/2020 | 94,559.00 | | 94,559.00 | - |
| Total | | | | | | | | | | | - | - | | 108,320.80 | | 108,320.80 | - |
| 2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | | | | | | | | | | | | | | |
| ................................ | | | | | | | | | | | | | | | | | |
| ................................ | | | | | | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | | | | | | | |
| 3. වෙනත් (පෞද්ගලික අංශය) | | | | | | | | | | | | | | | | | |
| ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් | C/2021/HR005 | 12 | 31 | 287 | 2 | 1 | 0 | 1302 | | | | 36,720.00 | | 36,720.00 | | 36,720.00 | - |
| මෙට්‍රොපොලිටන් ඔෆිස් | C/2021/HR005 | 12 | 31 | 287 | 2 | 1 | 0 | 1302 | | | | 21,978.00 | | 21,978.00 | | 21,978.00 | - |
| ග්ලෝබල් ඉන් පොයින්ට් | C/2021/HR008 | 12 | 31 | 287 | 2 | 1 | 0 | 1409 | | | | 560.00 | | 560.00 | | 560.00 | - |
| ශ්‍රී ලංකා | C/2021/HR007 | 12 | 31 | 287 | 2 | 1 | 0 | 1402 | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ටෙලිකොම් ශ්‍රී ලංකා | | | | | | | | | | | | 14,481.22 | | 14,481.22 | | 14,481.22 | - |
| ටෙලිකොම් ශ්‍රී ලංකා | C/2021/HR017 | 12 | 31 | 287 | 2 | 1 | 0 | 1402 | | | | 3,610.62 | | 3,610.62 | | 3,610.62 | - |
| ටෙලිකොම් | C/2021/HR020 | 12 | 31 | 287 | 2 | 1 | 0 | 1402 | | | | 306.50 | | 306.50 | | 306.50 | - |
| බී.පී.බී. ආයුපාල | C/2021/HR004 | 12 | 31 | 287 | 2 | 1 | 0 | 1409 | | | | 41,000.00 | | 41,000.00 | | 41,000.00 | - |
| එම්.ටී. දිසානායක එම්.ජී.එල්.එන්. | C/2021/HR004 | 12 | 31 | 287 | 2 | 1 | 0 | 1409 | | | | 3,500.00 | | 3,500.00 | | 3,500.00 | - |
| හෙලුම්කුමාරි | | 12 | 31 | 287 | 2 | 1 | 0 | 1402 | | | | 28,660.71 | | 28,660.71 | | 28,660.71 | - |
| *Total* | | | | | | | | | | | - | 58,698.00 | | 150,817.05 | - | 150,817.05 | - |
| මුළු එකතුව | | | | | | | | | | | - | 58,698.00 | | 259,137.85 | | 259,137.85 | - |

ගෙවීම්/බැදීම්වල ස්වභාවය පහත සඳහන් ආකාරයට හඳුනාගත යුතු ය.

1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු
2. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල
3. පෞද්ගලික අංශය

බැරකම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වත්කම් හා සේවාවන් ලැබී ඇති නමුත් ගිණුම් වර්ෂය තුළදී ඒ සඳහා අදාළ පාර්ශ්වයන්ට ගෙවීම් සිදුකර නොමැති ගනුදෙනුය.

බැදීම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අදාළ වත්කම් හෝ සේවාව ආයතනය වෙත ලැබී නොමැති, එහෙත් එකී භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේ අරමුණින් බාහිර පාර්ශ්වයන් සමඟ එළඹ ඇති ගිවිසුම් හෝ ලිඛිත එකඟතාවයන්ය.

..............................................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024.03.26

ප්‍රධාන ගණකාධිකාරී
අංක. 1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

සටහන - (iv)

<u>බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i)</u>

**මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය**

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය:287

වැඩසටහන් අංකය හා නාමය:

| පුද්ගලයාගේ /ආයතනයේ නම | බැඳීම පිළිබඳ විස්තරය | ව්‍යාපෘතිය | උප ව්‍යාපෘතිය | වැය විෂය සංකේතය | මූල්‍යකරණ සංකේතය | මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.) | මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තු ගත (රු.) | බැඳීම් හා බැරකම් වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| 1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු | | | | | | | | XX |
| ..................................... | | | | | | | | XX |
| ..................................... | | | | | | | | |
| එකතුව | | | | | | | | |
| 2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | | | | | XX |
| ..................................... | | | | | | | | XX |
| ..................................... | | | | | | | | |
| එකතුව | | | | අදාළ නොවේ | | | | |
| 3. වෙනත් (පෞද්ගලික අංශය) | | | | | | | | XX |
| ..................................... | | | | | | | | XX |
| ..................................... | | | | | | | | |
| එකතුව | | | | | | | | |
| **මුළු එකතුව** | | | | | | | | |

.....................................................

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2021.03.16

සටහන - (v)

**<u>බැරකම් පිළිබඳ ප්‍රකාශය - (ii)</u>**

**මු.රෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන**

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය:287

| පුද්ගලයාගේ/ආයතනයේ නම* (ප්‍රතිපාදන මාරු කරන විට හඳුනාගෙන තිබිය යුතුය) | වගකීම් පිළිබඳ විස්තරය | ණයවර ලිපි අංක ආදිය | ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීර්ෂයකින්ද | | | | තැන්පතු ගිණුම් අංකය | මාරුකරන ලද මුදල රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යාපෘතිය | උප ව්‍යාපෘතිය | වැය විෂය සංකේතය | මූල්‍යකරණ සංකේතය | | |
| 1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු | | | | | | | | |
| .................................... | | | | | | | | |
| .................................... | | | | | | | | |
| එකතුව | | | | | | | | |
| | | | | | | | | |
| 2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | | | | | |
| .................................... | ——— | ——— | ——— | අදාළ නොවේ | ——— | ——— | ——— | ——— |
| .................................... | | | | | | | | |
| එකතුව | | | | | | | | |
| | | | | | | | | |
| 3. වෙනත් (පෞද්ගලික අංශය) | | | | | | | | |
| .................................... | | | | | | | | |
| .................................... | | | | | | | | |
| එකතුව | | | | | | | | |
| **මුළු එකතුව** | | | | | | | | |

සටහන - (vi)

## ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| 1 | ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ, පරිපූරක වෙන්කිරීම්ද ඇතුළුව 2020 ඇස්තමේන්තුගත වෙන්කිරීම් | ………… |
| 2 | ඉහත (1) ට අදාළ 2020 වර්ෂය තුළදී දරන ලද මුළු වියදම | ………… |
| 3 | 2020 ජනවාරි 01 දිනට ලැබීමට නියමිත තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව | ………… |
| 4 | 2019 හා ඊට පෙර වර්ෂවලට අදාළව, 2020 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව (ඇත්නම්) | ………… |
| 5 | 2020 වර්ෂය සම්බන්ධයෙන් 2020 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව | ………… |
| 6 | 2019 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිමිකම්පැමි සම්බන්ධයෙන් 2020 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමිවල එකතුව | ………… |
| 7 | 2020 වර්ෂය සම්බන්ධයෙන් 2020 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමිවල එකතුව | ………… |
| 8 | 2019 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් 2020 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව | ………… |
| 9 | 2020 වර්ෂය වෙනුවෙන් 2020 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව | ………… |
| 10 | 2020 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව (3+4+5) - (6+7) - (8+9) | ………… |
| 11 | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2019 වර්ෂය සම්බන්ධයෙන් 2019 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව | ………… |
| 12 | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2020 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව | ………… |
| 13 | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව (10 + 11 - 12) | ………… |

සටහන - (vii)

## අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 287

| දිනය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීමේ ස්වභාවය | ගණන (රු) |
|---|---|---|---|---|
| | | අදාළ නොවේ | | |

සටහන - (viii)

**2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2020.12.31 දිනට තත්ත්ව වාර්තාව**

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 287

| අනු අංකය | බැංකුවේ නම | ගිණුම් අංකය | 2020.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.) | 2020.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.) | 2020.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්) | අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය |
|---|---|---|---|---|---|---|
| 01 | මහජන බැංකුව-බත්තරමුල්ල ශාඛාව | 208-1002-59027251 | 17,162,781.90 | 0 | 1,070,226.48 | 2021 ජනවාරි |

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| - | - | - | - | - | - |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 476,500,000 | 476,500,000 | 471,036,399 | 98.85% |
| ප්‍රාග්ධන | 3,100,000 | 3,100,000 | 3,006,339 | 96.97% |

### 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| 1 | ඉඩම් අමාත්‍යාංශය | බිම්සවිය වැඩසටහන සඳහා | 87,930,359.03 | 87,930,359.03 | 87,929,638.06 | 100% |
| 2 | ප.සභා පලාත් පාලන අමාත්‍යාංශය | අභ්‍යාසලාභී පුහුණු දීමනා ගෙවීම | 80,000.00 | 80,000.00 | 79,000.00 | 100% |
| 3 | ආරක්ෂක අමාත්‍යාංශය | අභ්‍යාසලාභී පුහුණු දීමනා ගෙවීම | 160,000.00 | 160,000.00 | 160,000.00 | 100% |
| 4 | මැතිවරණ කො.සභාව | මැතිවරණ කාර්යය මණ්ඩල ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම | 2,806,581.75 | 2,806,581.75 | 2,806,581.75 | 100% |
| 5 | විශ්‍රාම වැටුප් දෙපා. | විශ්‍රාම පාරිතෝෂිකයෙන් රජයට අයවීමට ඇති ණය ශේෂ පියවා ගැනීමට | 403,842.83 | 403,842.83 | 403,842.83 | 100% |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | භාණ්ඩ සමීක්ෂණ වාර්තා පිළියෙල කරමින් පවතී | 36,400,000 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 214,182,237 | | |
| 9153 | ඉඩම් | - | - | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

*(ඇමුණුම් අංක 03 හි දක්වා ඇත)*

# පරිච්ඡේදය 04
# කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | **100% - 90%** | **75% - 89%** | **50% - 74%** |
| 12 වගන්තිය යටතේ ගැසට් කිරීම | | 82.54% | |
| බෙදා දුන් හිමිකම් අයදුම්පත් ගණන | | | 52.95% |
| හිමිකම් විමර්ශන පැවැත්වීම | 114.86% | | |
| ඉ.රෙ.පරීක්ෂණ පැවැත්වීම | | | 52.37% |
| 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම | | | 67.41% |
| 14 වගන්තිය යටතේ ගැසට් කිරීම | | | 56.96% |
| හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත උපලේඛන යැවීම | | | 54.81% |

# පරිච්ඡේදය 05
# තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණු | ඉලක්කය | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% -100% |
| ස්ත්‍රී පුරුෂ භාවය සහා හිමිකම් මාදිලියට අනුව, නීත්‍යානුකූලව පිළිගත් ලිපි ලේඛන සහ සුරක්ෂිත ඉඩම් හිමිකම් සහිත මුළු වැඩිහිටි ජනගහනයේ ප්‍රමාණය | හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම | 12 වගන්තිය යටතේ ගැසට් කිරීම | | | 82.54 % |
| | | බෙදා දුන් හිමිකම් අයදුම්පත් ගණන | | 52.95% | |
| | | හිමිකම් විමර්ශන පැවැත්වීම | | | 114.86 % |
| | | ඉ.රෙ.පරීක්ෂණ පැවැත්වීම | | 52.37% | |
| | | 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම | | 67.41% | |
| | | 14 වගන්තිය යටතේ ගැසට් කිරීම | | 56.96% | |
| | | හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත උපලේඛන යැවීම | | 54.81% | |

## 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- බිම්සවිය වැඩසටහනේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට දෙපාර්තමේන්තුව සතු මානව සම්පත් ප්‍රමාණවත් නොවීම.
- 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සඳහා සංශෝධන ඇතුළත් කිරීමට පියවර ගැනීම.
- ප්‍රාදේශීය කාර්යාල අතර සම්බන්ධීකරණය ඉහළ නැංවීමට දිස්ත්‍රික් කාර්යාල ස්ථාපනය කිරීමට කටයුතු ආරම්භ කිරීම.

# පරිච්ඡේදය 06
# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 105 | 32 | 74 |
| තෘතියික | 07 | 6 | 01 |
| ද්විතියික | 1746 | 635 | 1111 |
| ප්‍රාථමික | 254 | 143 | 111 |

## 6.2 ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි මානව සම්පත් හිඟයෙහි/ අතිරික්තයෙහි බලපෑම

පුහුණු වැඩමුළු පැවැත්වීම තුලින් නිලධාරින්ගේ රාජකාරි පිළිබඳ හා විෂය කරුණු පිළිබඳ දැනුම , කුසලතා , ආකල්ප සංවර්ධනය කිරිම ආපේක්ෂා කරයි. එමගින් නිලධාරින්ගේ ඵලදායීතාවය වර්ධනය කිරීම බලාපොරොත්තුවේ. කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන්, 2020 වර්ෂයේ තුල සැලසුම් කල පුහුණු වැඩසටහන් වලින් පැවැත්වීමට හැකියාව ලැබුනේ 25%ක ප්‍රමාණයක් පමණි. එබැවින් ආපේක්ෂිත පුහුණු ඉලක්ක කරා ලඟා වීමට නොහැකිවිය.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටනේ කාල සීමාව | සමස්ථ අයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| බිම් සවිය වැඩමුළුව ආපසු හැරී බැලීමක් වැඩමුළුව | 80 | 2020.10.02–2020.10.03 | 112,560.00 | | දේශීය | |
| බිම් සවිය වැඩසටහන පිළිබඳ උතුරුමැද පළාත් වැඩමුළුව | 60 | 2020.12.10 | 48,210.00 | | දේශීය | |
| බිම් සවිය වැඩසටහන පිළිබඳ මධ්‍යම පළාත් වැඩමුළුව | 75 | 2020.12.19 | 42,500.00 | | දේශීය | |
| උපාධිධාරි නවක නිලධාරින් පුහුණු කිරීමේ වැඩමුළුව | 40 | 2020.12.22 – 2020.12.24 | 95,150.00 | | දේශීය | |

## ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි පුහුණු වැඩසටහන් වල දායකත්වය

- ප්‍රාදේශීය කාර්යාල කිහිපයක නිත්‍ය සහකාර කොමසාරිස්වරුන් නොමැතිවීම හේතුවෙන් වැඩබැලීමේ පදනම මත සහකාර කොමසාරිස්වරු හා සහකාර ප්‍රාදේශීය ලේකම්වරු පත්කර තිබුණි. එබැවින් ඔවුන්ගෙන් දෙපාර්තමේන්තුවට පූර්ණ සේවාවක් ලබා ගැනීමට අපහසුවිය. නමුත් 2020 වර්ෂය මුල භාගයේ නවක පරිපාලන සේවයේ නිලධාරීන් හා අවසාන භාගයේ දී කොන්ත්‍රාත් පදනම මත සහකාර කොමසාරිස්වරු බඳවා ගැනීම් සිදුකල නිසා පුරප්පාඩුව පැවති පුත්තලම, දඹුල්ල, ගලේවෙල , ගහවටකෝරළය, වැලිගෙපොල, රත්නපුර, කුරුවිට, මහර, කෝට්ටෙ, බෙලිඅත්ත,ඇල්පිටිය ආදී කාර්යාලවලට නිත්‍ය සහකාර කොමසාරිස්වරුන් පත් කිරීමට හැකිවිය. එමඟින් පූර්ණ සේවාවක් ලබා ගැනීමට අපේක්ෂා කරයි.

- දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර රාජකාරි කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා සංවර්ධන නිලධාරි තනතුරු 687ක් අනුමත වූ අතර තනතුරු පුරප්පාඩු සහිත ප්‍රාදේශීය කාර්යාල සඳහා නිළධාරින් බඳවා ගැනීම සිදුකරමින් පවතී.

- කළමණාකරන සේවා නිළධාරින් හා කාර්යාල සේවක සේවයේ නිළධාරි හිඟය දෙපාර්තමේන්තුවේ සමස්ථ ක්‍රියාවලියට බලපෑම් කර ඇත.

# පරිච්ඡේදය 07

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යා තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 01 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශය | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | | |
| 1.6 | වෙනත් | - | | |
| 02 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 04 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරිම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරිම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරිම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 05 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 06 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරිම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 07 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | වසරේ අවසාන කාර්තුව තුළ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වීම | |
| 08 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණයවූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල නොවේ | | |
| 09 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | පරිපාලනමය හේතු | තීරණ ගැනීමේ ප්‍රමාදයන් අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල නොවේ | කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් බොහෝමයක් වාහන වල ඉන්ධන දහනය පරික්ෂා කිරීමට නොහැකි විය | 2021 වර්ෂය තුලදී දෙපාර්තමේන්තුවේ සියළුම වාහන වල ඉන්ධන පරික්ෂාවන් සිදු කිරීම |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදි හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දි ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල නොවේ | ප්‍රතිපාදන සුළු ප්‍රමාණයකින් ප්‍රමාණවත් නොවීම | |
| 12 | **රජයේ නිළධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | ණයකරු සහ ඇපකරුවන්ගේ ස්ථිර ලිපිනයන් වෙනස් වීමෙන් , සම්බන්ධ කර ගැනීමට නොහැකි වීම | 2021 වර්ෂයේ දී එය කපාහරින ලදි |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අදාළ නොවේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අදාළ නොවේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාළ නොවේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල නොවේ | අනුමත කාර්ය මණ්ඩලයට අනුව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නැත | අවශ්‍ය පරිදි කාර්ය මණ්ඩල ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 2017.09. 20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | චක්‍රෙල්ඛයේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කර නැත | 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | 2020 වසරේ දී විගණන ඡේද ලැබී නැත | | |


## ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

## නිරවුල් කිරීමේ නිලධාරින් / කොමසාරිස්වරුන්ගේ/ කොමසාරිස් ජනරාල්වරුන්ගේ නාම ලේඛනය

| | |
|---|---|
| 1903 – 1905 | ජේ.ජී. ෆ්‍රේසර් මහතා |
| 1906 | එච්.ඕ. ෆොක්ස් මහතා (වැ.බ.) |
| 1907 – 1912 | ජේ.ජී. ෆ්‍රේසර් මහතා |
| 1913 | එච්.ඕ. ෆොක්ස් මහතා |
| 1914 | ජේ.එම්. ඩේවිස් මහතා (වැ.බ.) |
| 1915 -1917 | එච්.ඕ. ෆොක්ස් මහතා |
| 1918 | ජේ.එම්. ඩේවිස් මහතා (වැ.බ.) |
| 1919 – 1920 | එච්.ඕ. ෆොක්ස් මහතා |
| 1921 | ඩබ්ලිව්.ඊ. වේට් මහතා |
| 1922 – 1923 | එම්.එම්. වෙද්‍රබර්න් මහතා (වැ.බ.) |
| 1924 | එම්.ටී. ආච්බල්ඩ් මහතා (වැ.බ.) |
| 1925 | එෆ්. බාට්ලට් මහතා |
| 1926 – 1927 | එම්.ටී. ආච්බල්ඩ් මහතා (වැ.බ.) |
| 1928 | එම්.ටී. ආච්බල්ඩ් මහතා |
| 1929 – 1930 | ඩබ්ලිව්.ටී. ස්ටේස් මහතා |
| 1931 – 1936 | එච්.ඊ. ජැන්ස් මහතා (වැ.බ.) |
| 1937 – 1939 | එච්.ඊ. ජැන්ස් මහතා |
| 1940 | සී.එල්. වික්‍රමසිංහ මහතා |
| 1941 – 1944 | එච්.ඊ. ජැන්ස් මහතා |
| 1945 – 1947 | සී.බී.පී. පෙරේරා මහතා (වැ.බ.) |
| 1948 – 1950 | සී.බී.පී. පෙරේරා මහතා |
| 1951 – 1954 | එම්.ඩබ්ලිව්.එෆ්. අබේකෝන් මහතා (වැ.බ.) |
| 1955 – 1958 | එම්.ඩබ්ලිව්.එෆ්. අබේකෝන් මහතා |
| 1959 | එස්.එල්. ද සිල්වා මහතා (වැ.බ.) |
| 1960 | ආර්.ටී. රත්නතුංග මහතා (වැ.බ.) |
| 1961 – 1963 | ආර්.ටී. රත්නතුංග මහතා |
| 1964 – 1974 | එස්.එල්. ද සිල්වා මහතා |
| 1975 – 1978 | සී.එස්. රණසූරිය මහතා |
| 1979 – 1980 | අයි.ඒ. එදිරිවීර මහතා |
| 1981 – 1983 | කේ.පී. විමලධර්ම මහතා |
| 1984 – 1987 | ආර්.ඩබ්ලිව්. පියසේන මහතා |
| 1988 | ඒ. බොරළුගොඩ මහතා (වැ.බ.) |
| 1989 | ඩී.ජී.පී. සෙනෙවිරත්න මහතා |
| 1990 – 1993 | ආර්.එම්.සී.පී. උඩුගම්පල මහත්මිය |
| 1994 | එච්. උඩකන්දගේ මහතා (වැ.බ.) |
| 1995 - 1997 | ආර්.එම්.සී.පී. උඩුගම්පල මහත්මිය |
| 1997 – 2001 | එච්. උඩකන්දගේ මහතා |
| 2002 – 2003 | එස්. එච්. විතානගේ මහතා |
| 2004 – 2005 | කේ.ඒ.ඩී.පී. පෝල් මහතා |
| 2006 – 2008 | පී.ඒ. මුතුකුමාරණ මහතා |
| 2009 – 2010 | ජී. විජිත නන්ද කුමාර් මහතා |
| 2011 | එල්.කේ. ප්‍රේමරත්න මහතා |
| 2012 - 2013 | ඒ.එච්.එස්. විජේසිංහ මහතා |
| 2013 - 2015 | ගාමිණී ඉලංගරත්න මහතා |
| 2015 | ජී. විජිත නන්ද කුමාර් මහතා |
| 2015 - 2018 | කේ. ඒ. කේ. රංජිත් ධර්මපාල මහතා |
| 2019 සිට මේ දක්වා | පී.එම්.එච්. ප්‍රියදර්ශනී මහත්මිය |

ඇමුණුම අංක 02

# ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. AGL/A/LSD/2/2020/04 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021 අගෝස්තු 12 දින

ගණන්දීමේ නිලධාරී

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳව විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| | ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1.6.2 (අ) | 2019 දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික වැඩ තහනමට ලක් වූ සහ සේවය හැරගිය නිලධාරීන්ගෙන් ලද ණය ශේෂ එකතුව රු.499,305 ක් වූ අතර | නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ හිටි ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

එම හිඟ හිටි ණය ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 කට වැඩි කාල පරාසයක සිට පැවත එමින් තිබූ නමුත් එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

#### 1.6.1.1 භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශන සැසඳීම

භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ-6) සැසඳීමේදී පහත නොසැසඳීම් නිරීක්ෂණය විය.

(අ) ආරම්භක ශේෂ අතර නොසැසඳීම්

සමාලෝචිත වර්ෂයේ, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් (එස්ඒ-82) වල කාර්යාල උපකරණ ආරම්භක ශේෂ වටිනාකම රු.5,273,127 ක් ලෙස සටහන් වුවද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) එම වටිනාකම රු.5,953,637ක් ලෙස සටහන් වීම හේතුවෙන් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්(එස්ඒ-82) වල රු.45,633,838ක් ලෙස සටහන් වූ පරිගණක, විදුලි උපකරණ හා ගෘහ භාණ්ඩ ආරම්භක ශේෂ වටිනාකම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ(ඒසීඒ-6) රු.44,105,410 ක් ලෙස සටහන් කිරීමෙන්ද, එම ආරම්භක ශේෂ වටිනාකම් අතර රු. 847,918 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මිලදී ගැනීම් අතර නොසැසඳීම්

භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්(එස්ඒ-82) වල ඇතුළත් නොවූ රු.105,840 ක් වූ කාර්යාල උපකරණ මිලදී ගැනීම්,මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) සටහන් කිරීමෙන්ද, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්(එස්ඒ-82) වල රු.483,379ක් ලෙස සටහන් වූ පරිගණක හා ගෘහභාණ්ඩ මිලදී ගැනීම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ(ඒසීඒ-6) රු.1,225,457ක් ලෙස සටහන් කිරීමෙන්ද, එම මිලදී ගැනීම් වටිනාකම් අතර රු.847,918 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.6.1.2 මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් හා මූලධන වියදම් නොසැසඳීම**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළදී මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් වශයෙන් ඒසීඒ-6 ආකෘතියේ දක්වා තිබුණු වටිනාකම රු.1,364,847 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ ඒසීඒ 2(i) ආකෘතියෙහි එය රු.516,928 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන්, රු.847,919 ක වෙනසක් නිරීක්ෂණය විය. බිම් සවිය වැඩසටහන(ශීර්ෂ-122) යටතේ මිලදී ගැනීම් ඒසීඒ-6 ආකෘතියට ඇතුළත් කර තිබීම මෙයට හේතු ලෙස විගණනයට වාර්තා කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීම**

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන් පරිදි වේ.

| | නීති රීති රෙගුලාසිය | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (i) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකට ම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව දෙපාර්තමේන්තුව විසින් පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙළ කර ක්‍රියාත්මක කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛනයේ ඇමුණුම් 02 ආකෘතිය | චක්‍රලේඛයේ ඇමුණුම 02 පරිදි එම ආකෘතිය පදනම් කරගෙන දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සැලැස්ම පිළියෙළ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**2.2 බැංකු ගිණුම් මෙහෙයවීම**

දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය බැංකු ගිණුමකින් නිකුත් කළ 2020 දෙසැම්බර් 31 දින වන විට මාස 06 ඉක්ම වූ නමුත් බැංකුවට ඉදිරිපත් නොකරන ලද එකතුව රු.1,070,226 ක් වූ චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් මු.රෙ.396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි .

**2.3 රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

(අ) විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 04කට වැඩි කාලයක සිට අය නොවූ රු.197,178 ක ණය ශේෂය ආයතන සංග්‍රහය xxiv පරිච්ඡේදයේ 4.2 ඡේදය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 30 දින වැඩ තහනමට ලක් කරන ලද නිලධාරියෙකුගේ විනය ක්‍රියාමාර්ග අවසන් නොවීම නිසා රු.93,730 ක ණය ශේෂය අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නොහැකි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

**3.1.1 කළමනාකරණයේ දුර්වලතා**

(අ) 2020 වර්ෂය සඳහා බිම්සවිය වැඩසටහන වෙනුවෙන් රු.87,930,359 ක ප්‍රතිපාදනයක් සලසා ගෙන ඉඩම් කැබලි 70,560 ක් සඳහා හිමිකම් සහතික නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද එම මුළු මුදලම වැයකර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉඩම් කැබලි 23,411 ක් සඳහා පමණක් හිමිකම් සහතික නිකුත් කර තිබුණි.ඒ අනුව හිමිකම්

සහතිකයක් නිකුත් කිරීමට ඇස්තමේන්තුගත මුදල රු.1,246 ක් වුවත්, රු.3,756 ක් වැයකර තිබුණි.

(ආ) බිම්සවිය වැඩසටහන යටතේ හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා ක්ෂේත්‍ර විමර්ශන පැවැත්වීම ,12 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයට කඩයිම් සිතියම් ලබා ගැනීම ,හිමිකම් අයදුම්පත් බෙදා දීම, ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ පත්ඉරු පරීක්ෂා කිරීම ,14 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම, 14 වගන්තිය යටතේ ගැසට් කිරීම සහ ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙත ඉඩම් කැබලි පිළිබඳ තොරතුරු යැවීම යන සියලු අදියරයන් සම්පූර්ණ විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ සැලසුම්ගත ඉලක්ක අගෝස්තු 28 දින සංශෝධනය කිරීමෙන් පසුවද පළමු හා දෙවන අදියර හැර සෙසු අදියරයන්හි ප්‍රගතිය සියයට 52 සිට සියයට 67 අතර පහළ පරාසයක පැවතුණි.

(ඇ) හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය අතරතුර සිදුවූ ගැටලු හේතුවෙන් 2015 සිට සමාලෝචිත වර්ෂය දක්වා ලිපිගොනු 505,959 ක් පසෙක තබා තිබූ අතර ඉන් ලිපි ගොනු 52,092 ක්පමණක් එනම් සියයට 10 ක් පමණ නිරවුල් කර තිබුණි. මෙම ක්‍රියාවලියේ අදියරයන් අතර, විධිමත් සම්බන්ධතාවයක් නොමැති වීම හේතුවෙන් මේ ආකාරයට වැඩසටහනේ අරමුණ වූ හිමිකම් සහතික නිකුත් කිරීම ප්‍රමාද වී තිබුණි.

## 3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩුබාහිරාදිය බාර ගැනීම හෝ බාරව සිටීම එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ බඩුබාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධව පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරීන් පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යා යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 4. යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

මු. රෙ. 133 අනුව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය පරිදි දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, එම නිලධාරීන් ඉඩම් කළමණාකරණ රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත කිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුව තුළ සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මස සිට අභ්‍යන්තර විගණන ඒකකය ක්‍රියාත්මක වී නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 5. මානව සම්පත් කළමණාකරණය

දෙපාර්තමේන්තුවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 105 | 50 | 55 |
| තෘතීක මට්ටම | 7 | 7 | 0 |
| ද්විතීක මට්ටම | 1746 | 635 | 1111 |
| ප්‍රාථමික මට්ටම(ස්ථිර/කොන්ත්‍රාත්) | 254 | 143 | 111 |
| එකතුව | 2112 | 835 | 1277 |

ඉහත තොරතුරු වලට අනුව පහත සඳහන් නිරීක්ෂණයන් ඉදිරිපත් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 55 ක් හා තෘතියක හා ද්විතීක මට්ටමේ පුරප්පාඩු 1222 ක් ඇතුළු සමස්ත පුරප්පාඩු 1277 ක් පැවතුණි.

(ආ) අනුමත වී තිබූ කොමසාරිස් තනතුරු 02ක්, දිස්ත්‍රික් කොමසාරිස්වරු 03ක්,නියෝජ්‍ය / සහකාර කොමසාරිස් තනතුරු 47ක්, නීති නිලධාරී, අභ්‍යන්තර විගණක හා ගණකාධිකාරී යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 55ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ සැලසුම්ගත ඉලක්ක හා අරමුණු ලගාකරගැනීම දුෂ්කර වී තිබුණි.

(ඇ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ නියෝජ්‍ය / සහකාර කොමසාරිස් තනතුර සඳහා නිලධාරීන් 19 ක් හා තෘතීක මට්ටමේ පරිපාලන නිලධාරී තනතුර සඳහා ස්ථිරව නිලධාරීන් පත් නොකර කොන්ත්‍රාත් පදනම මත පත්කර තිබුණි.

(ඇ) ද්විතීක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 7 ක පවතින ඇබෑර්තු 1222 ක් පිරවීමට හෝ සේවා අවශ්‍යතාවය නැවත සලකා බලා අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

ආර්.එම්. රත්නායක
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට
ආර්. එම්. රත්නායක
සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

8